# දැන්වීමයි.

# සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව**
**සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ භාෂා පරිවර්තක II වැනි ශ්‍රේණියේ තනතුරුවලට**
**බඳවා ගැනීම - 2025 (දීපව්‍යාප්ත මට්ටමින්)**

සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ භාෂා පරිවර්තක II ශ්‍රේණියේ තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා දීපව්‍යාප්ත මට්ටමින් සුදුසුකම් ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව :-

| තනතුර | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|
| භාෂා පරිවර්තක (සිංහල/දෙමළ) | 01 |
| භාෂා පරිවර්තක (සිංහල/ඉංග්‍රීසි) | 02 |

02. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය :- 2026.01.15

03. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස :- අවුරුදු 21ට නොඅඩු සහ 35ට නොවැඩි විය යුතුය.

05. මෙම තනතුරට අදාළ වැටුප් පරිමාණය :-

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 හා 2025.03.25 අනුව **භාෂා පරිවර්තක II** වැනි ශ්‍රේණියට අදාළ වැටුප් කාණ්ඩය MN 6 - 2025 වන අතර වැටුප් පරිමාණය රු. 62,230- 10×1,190- 11×1,360- 15×1,670- රු.114,140/- වේ. මෙයට අමතරව රජයේ නිලධරයන් වෙත රජය විසින් කලින් කළට ගෙවනු ලබන වෙනත් දීමනා ද හිමි වේ.

06. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ඉහළම කුසලතාවය ලබා ගන්නා අයදුම්කරුවන් සඳහා පමණක් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව පත්වීම් ලබා දීම සිදුකෙරේ.

07. මෙම බඳවා ගැනීමේ සම්පූර්ණ නිවේදනය සහ ආදර්ශ අයදුම්පත්‍ර www.sg.gov.lk හා www.psc.sg.gov.lk වෙබ් අඩවිවල පළකර ඇත.

ඩබ්.ආර්. දිනීෂා එස්. රත්නායක
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත

2025.12.10

ඩබ්.ආර්. දිනීෂා එස්. රත්නායක
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත.

**සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

**සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ භාෂා පරිවර්තක II වැනි ශ්‍රේණියේ තනතුරුවලට**

**බඳවා ගැනීම - 2025 (දීපව්‍යාප්ත මට්ටමින්)**

**1.0** 2020.06.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද සබරගමුව පළාත් භාෂා පරිවර්තක තනතුර - ක්ෂේත්‍රගත/ කාර්යාලගත නිලධාරී බණ්ඩ 1 සේවා ගණය (MN6-2025) සඳහා වන බඳවා ගැනීමේ පරිපාටියේ විධිවිධාන අනුව සහ ආණ්ඩුකාර ලේකම්ගේ අංක GS/ES/6/11/1/I හා 2025.11.06 දිනැති ලිපිය මගින් ලබා දී ඇති අනුමැතිය ප්‍රකාරව **භාෂා පරිවර්තක II වැනි ශ්‍රේණියේ තනතුරුවලට** බඳවා ගැනීම සඳහා දීපව්‍යාප්ත මට්ටමින් සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| තනතුර | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|
| භාෂා පරිවර්තක (සිංහල/දෙමළ) | 01 |
| භාෂා පරිවර්තක (සිංහල/ඉංග්‍රීසි) | 02 |

වැදගත්:- ඔබ මෙම තනතුර සඳහා සුදුසුකම් ලද හොත් සබරගමුව පළාතේ අවම වශයෙන් වසර 05 ක් සේවය කිරීමට යටත්ව දීපව්‍යාප්ත මට්ටමින් අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන අයදුම්කරුවන් සම්බන්ධයෙන් සළකා බලනු ඇත.

**2.0** සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ කොමිෂන් සභාව විසින් බලය පවරනු ලබන ආයතනයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින් බඳවා ගැනීම් සිදු කර සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ භාෂා පරිවර්තක II වැනි ශ්‍රේණියේ තනතුරු සඳහා පත් කිරීමට තෝරා ගනු ඇත.

**3.0** වැටුප : අංක 10/2025 හා 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව **භාෂා පරිවර්තක II වැනි ශ්‍රේණියට** අදාළ වැටුප් කාණ්ඩය MN 6 - 2025 වන අතර වැටුප් පරිමාණය රු. 62,230-10×1,190- 11×1,360- 15×1,670- රු.114,140/- වේ.

**4.0** තනතුරෙහි කාර්යභාරය

(i) සිංහල / දෙමළ භාෂා පරිවර්තකයෙකු - සිංහල භාෂාවෙන් ලැබෙන ලිපි දෙමළ භාෂාවටද දෙමළ භාෂාවෙන් ලැබෙන ලිපි සිංහල භාෂාවටද පරිවර්තනය කළහැකි වීම.

(ii) සිංහල / ඉංග්‍රිසි භාෂා පරිවර්තකයෙකු - සිංහල භාෂාවෙන් ලැබෙන ලිපි ඉංග්‍රීසි භාෂාවටද ඉංග්‍රීසි භාෂාවෙන් ලැබෙන ලිපි සිංහල භාෂාවටද පරිවර්තනය කළහැකි වීම.

**5.0** **සුදුසුකම් :- සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ භාෂා පරිවර්තක II වැනි ශ්‍රේණියේ** තනතුරුවලට බඳවා ගැනීම සඳහා පහත සඳහන් සුදුසුකම් අදාළ වේ.

5.1 අධ්‍යාපන සුදුසුකම්

<u>5.1.1. අධ්‍යාපන සුදුසුකම් : භාෂා පරිවර්තක (සිංහල/දෙමළ) සඳහා</u>

(i) අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී ගණිතය, සිංහල/දෙමළ භාෂාව ඇතුළු විෂයයන් 04කට සම්මාන සහිතව විෂයයන් හයකින් සමත් වී තිබීම.

සහ

(ii) දෙවන භාෂාව (සිංහල/දෙමළ) විෂයයට අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් සම්මාන සමාර්ථයක් ලබා තිබීම හෝ ඊට උසස් සුදුසුකමක් ලබා තිබීම.

සහ

(iii) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින්

පිළිගත් ආයතනයකින් පිරිනැමෙන දෙමළ භාෂාව ප්‍රධාන විෂයයක් වශයෙන් ඇතුළත් උපාධියක් ලබාතිබීම.

සහ

(iv) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයකින් පිරිනැමෙන පශ්චාත් උපාධියක් ලබාතිබීම.

<u>5.1.2 අධ්‍යාපන සුදුසුකම් : භාෂා පරිවර්තක (සිංහල/ඉංග්‍රීසි) සඳහා</u>

(i) අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී ගණිතය, සිංහල භාෂාව, ඉංග්‍රීසි විෂය අතුළු විෂයයන් 05කට සම්මාන සහිතව විෂයයන් හයකින් සමත් වී තිබීම.

සහ

(ii) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් පිරිනැමෙන ඉංග්‍රීසි භාෂාව ප්‍රධාන විෂයයක් වශයෙන් ඇතුලත් උපාධියක් ලබා තිබීම.

සහ

(iii) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයකින් පිරිනැමෙන පශ්චාත් උපාධියක් ලබාතිබීම.

5.2 වෘත්තීය සුදුසුකම්
තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් පරිගණක/ තොරතුරු තාක්ෂණය පිළිබඳ මාස 06ක පරිගණක / තොරතුරු තාක්ෂණ පාඨමාලාවක් හදාරා තිබීම. (NVQ Level 03)

5.3 කායික සුදුසුකම්
සෑම අපේක්ෂකයකුම සබරගමුව පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරී ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

5.4 වෙනත් සුදුසුකම්
(i) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.
(ii) අයදුම්කරු විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය.
(iii) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට වයස අවුරුදු 21 ට නොඅඩු හා අවුරුදු 35ට නොවැඩි විය යුතුය

සටහන : සෑම අයදුම්කරුවකුම තනතුරට අදාළ සියළු සුදුසුකම් **2026.01.15** වැනි දින හෝ ඊට පෙර හෝ සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

**6.0 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබාදෙන ක්ෂේත්‍ර සහ ලකුණු ප්‍රමාණයන්,**

| ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර | ලකුණු ප්‍රමාණය | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| I කොටස | 50 | 50 | |
| 1. භාෂා ප්‍රවීණතාවය | | (30) | |
| 1.1 ඉල්ලුම් කරන තනතුරට අදාළ භාෂාවන් සඳහා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් පිරිනැමෙන තනතුරට අදාළ භාෂා පරිවර්තක ඩිප්ලෝමා හෝ ඊට ඉහළ භාෂා පරිවර්තක සුදුසුකමක් ලබා තිබීම. | 15 | | |
| 1.2 ඉල්ලුම් කරන තනතුරට (සිංහල/දෙමළ) (සිංහල/ඉංග්‍රීසි) මූලික සුදුසුකම් සඳහා ඉදිරිපත් කරන උපාධියට අදාළවන භාෂාව හැර තනතුරට අදාළ අනෙක් භාෂාව සඳහා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් පිරිනැමෙන ඩිප්ලෝමාවක් හෝ ඊට ඉහළ සුදුසුකම් ලබා තිබීම. | 15 | | 20 |
| 2. පරිගණක සාක්ෂරතාවය<br>මූලික සුදුසුකම් සඳහා අදාළ වන පරිගණක සාක්ෂරතාවයට වඩා ඉහළ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් එක් අවුරුද්දක් හෝ ඊට ඉහළ පරිගණක/ තොරතුරු තාක්ෂණ පාඨමාලාවක් හදාර තිබීම. | 10 | (10) | |
| 3. සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය | 10 | (10) | |
| **මුළු ලකුණු ප්‍රමාණය** | 50 | | |
| 2 කොටස | 50 | 50 | |
| 1. පොදු වැදගත්කමක් ඇති පාඨයකින්, නිල ලේඛනයකින් හෝ වාර්තාවකින් උපුටාගත් කොටසක් සහ පුවත්පත් ලිපියකින් හෝ වාර්තාවකින් හෝ උපුටාගත් කොටසක් පහත සඳහන් ආකාර අනුව පරිවර්තනය කිරීම. | | | |
| 01. සිංහල/ඉංග්‍රීසි භාෂා පරිවර්තක තනතුරු සඳහා | (50) | (50) | 20 |
| 1.1 සිංහලෙන් ඉංග්‍රීසි බසට | 25 | | |
| 1.2 ඉංග්‍රීසියෙන් සිංහල බසට | 25 | | |
| 02. සිංහල/දෙමළ භාෂා පරිවර්තක තනතුරු සඳහා | (50) | (50) | |
| 2.1 සිංහලෙන් දෙමළ බසට | 25 | | |
| 2.2 දෙමළෙන් සිංහල බසට | 25 | | |
| මුළු එකතුව | 50 | | |

සටහන:

මෙම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය කොටස් 2කින් සමන්විත වන අතර, සමත්වීම සඳහා අවම වශයෙන් පළමු කොටසින් ලකුණු 20ක් ද, දෙවන කොටසින් ලකුණු 20ක් ද ලබාගත යුතු වේ. ලබාගත යුතු මුළු ලකුණු අවමය ලකුණු 40 වේ.

**7.0 විභාග ගාස්තු :**

I. විභාග ගාස්තුව රු. 1200/- කි. එම විභාග ගාස්තුව සබරගමුව පළාත් සභාවේ ඕනෑම අමාත්‍යාංශ කාර්යාලයකට / දෙපාර්තමේන්තුවකට ( පළාත් පාලන ආයතන හැර) හෝ සබරගමුව පළාත තුළ පිහිටා ඇති ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදලින් ගෙවා ඒ සඳහා නිකුත් කරන කුවිතාන්සිය අයදුම්පතේ අදාළ කොටුවේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. **<u>එම විභාග ගාස්තුව ගෙවිය යුත්තේ සබරගමුව පළාත් සභා ආදායම් ශීර්ෂ 20.03.02.99 ට බැරවන ලෙසය.</u>** ගෙවනු ලබන විභාග ගාස්තුව කිසිදු හේතුවක් මත ආපසු ගෙවනු නොලබන අතර, මුදල් ඇණවුම්, මුද්දර භාරගනු නොලැබේ. මුදල් ගෙවා ලබා ගන්නා ලද කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගත යුතුවේ.

II. දීපව්‍යාප්ත පදනමින් අයදුම් කරනු ලබන වෙනත් පළාත්වල අයදුම්කරුවන් රත්නපුර ප්‍රධාන තැපැල් කාර්යාලයෙන් මුදල් මාරු කර ගත හැකි වන පදිරි ඕනෑම තැපැල් කාර්යාලයකින් **"ලේකම්, සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව "** නමින් මුදල් ගෙවා ලබාගන්නා ලද මුදල් ඇණවුම (Money Order) අයදුම්පත්‍රයේ නියමිත තීරුවේ අලවා එම ඇණවුම් අංකය සඳහන් කර එවිය යුතුය. මුදල් ගෙවා ලබා ගන්නා ලද මුදල් ඇණවුමේ ඡායා පිටපතක් ළඟ තබා ගත යුතුවේ.

**8.0 අයදුම්පත්‍ර :**

ඒ 4 ( සාමාන්‍ය හාෆ්ෂීට් ) ප්‍රමාණයේ කඩදාසි භාවිත කරමින්,

(අ) අංක 01 සිට 04 තෙක් ඡේදයන් පළමුවන පිටුවටද,
(ආ) අංක 05 සිට ඉදිරියට වන ඡේදයන් අනෙක් පිටුවලටද, ඇතුළත් වන සේ පිළියෙල කරගත් අයදුම්පත්‍රය තම අත් අකුරින්ම පිරවිය යුතුය.
(ඇ) අයදුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කළ යුතුය.

නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිඳු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසිපරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරාගත යුතුය. ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇති අතර, සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රය විභාග නිවේදනයේ දැක්වෙන ඉල්ලුම් පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතුවේ. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැක.

8.1 මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර හෝ ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කර ඇති සියලු අයදුම්කරුවන්ට ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමට සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ඉඩදෙනු ලැබේ. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

8.2 අයදුම්පත්‍රයේද ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා වන ප්‍රවේශ පත්‍රයේද අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. කිසියම් ආයතනයකින් විභාගයට අයදුම්කරන අයදුම්කරුවෙකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා ද එසේ නොවන අයදුම්කරුවෙකු තම අත්සන රජයේ පාසලක ප්‍රධානියකු/විශ්‍රාමික නිලධාරියකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයකු, සාමදාන විනිශ්වයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු , නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරීලත් නිලධාරියකු, රජයේ හෝ පළාත් හෝ රාජ්‍ය සේවයේ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයකු හෝ ලවා සහතික කරවාගත යුතුය.

8.3 සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර 2026.01.15 වන දිනට හෝ ඊට පෙර "**ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, සබරගමුව පළාත් සභා සංකීර්ණය, නවනගරය, රත්නපුර**" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

8.4 අයදුම්පත්‍රය බහා එවන කවරයේ වමත් පස ඉහළ කෙළවරේ **"සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ භාෂා පරිවර්තක II වැනි ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම - 2025"** යන්න හා ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය සඳහන් කරන්න.

**9.0** අපේක්ෂකයන්ගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් එකක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.

I. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත.

II. වලංගු විදේශ ගමන් බලපත්‍රය.

III. වලංගු රියදුරු බලපත්‍රය

**10.0 ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම්**

ඉල්ලුම් පත්‍රය පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් හෝ ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට පිළිවන.

**11.0** මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වේ.සියලුම අයදුම්කරුවන් මෙම නිවේදනයේ සඳහන් පොදු විභාග නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.**මෙහි සිංහල හා දෙමළ නිවේදන අතර කිසියම් අනනුකූලතාවයක් පවතී නම් එවැනි විටක සිංහල මාධ්‍යය නිවේදනය අනුව කටයුතු කරනු ලැබේ.**

2025.12.10 දින
සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන්
සභා කාර්යාලය,
සබරගමුව පළාත් සභා සංකීර්ණය,
නවනගරය, රත්නපුර.

ඩබ්.ආර්. දිනීෂා එස්. රත්නායක
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත

ඩබ්.ආර්. දිනීෂා එස්. රත්නායක
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත

ආදර්ශ අයදුම් පත්‍රය

**සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ භාෂා පරිවර්තක II වැනි ශ්‍රේණියේ තනතුරට**
**බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2025 (දීපව්‍යාප්ත මට්ටමින්)**

**Open Competitive Examination for the Recruitment to the post of Translators - Grade II in the Sabaragamuwa Provincial Public Service – 2025 (Islandwide)**

---

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය
සිංහල - 2
දෙමළ - 3 ☐
ඉංග්‍රීසි - 4
(කොටුව තුළ අදාළ අංකය ලියන්න)

☐ (කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

1.0 1.1 මුල්'කුරු අගට යොදා මුල්'කුරු සමඟ නම ..............................
( ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා : PERERA, A.B.C

1.2 සම්පූර්ණ නම ..............................
( ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.3 සම්පූර්ණ නම ..............................
( සිංහලෙන් / දෙමළෙන්)

1.4 ජාතික හැඳුනුම්පත් අංකය ☐☐☐☐☐☐☐☐☐☐

1.5 දුරකථන අංකය ☐☐☐☐☐☐☐☐☐☐

1.6 ඉල්ලුම් කරන තනතුර : ..............................
(භාෂා පරිවර්තක(සිංහල/දෙමළ) හෝ (සිංහල/ඉංග්‍රීසි)
යන වග පැහැදිලිව සඳහන් කරන්න)

2.0 2.1 ස්ථිර ලිපිනය ..............................
( ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) ..............................

2.2 ස්ථිර ලිපිනය ..............................
( සිංහලෙන් / දෙමළෙන්) ..............................

2.3 ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය ..............................
( ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) ..............................

3.0 3.1 අයදුම්කරු ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :..............................
3.2 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය :..............................
3.3 පදිංචිව සිටින කාලසීමාව : ..............................
3.4 ග්‍රාම නිලධාරී කොට්ඨාශය : ..............................

4.0 4.1 ස්ත්‍රී/ පුරුෂ භාවය ස්ත්‍රී - 1 ☐ (කොටුව තුළ අදාළ
පුරුෂ - 0 අංකය ලියන්න)

4.2 උපන් දිනය: වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

4.3 2026.01.15 වන දිනට වයස: අවුරුදු ☐☐ මාසය ☐☐ දිනය ☐☐

5.0 අධ්‍යාපන සුදුසුකම්

5.1 අ.පො.ස. (සා.පෙළ) විභාගය පිළිබඳ විස්තර (විභාග දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ප්‍රතිඵල ලේඛනයේ පිටපතක් ඇමිණිය යුතුය.)

වර්ෂය:- .................... විභාග අංකය : ........................

| අනු අංකය | විෂයය | සාමාර්ථය | අනු අංකය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|---|---|
| 01 | | | 06 | | |
| 02 | | | 07 | | |
| 03 | | | 08 | | |
| 04 | | | 09 | | |
| 05 | | | 10 | | |

5.2 ලබා ඇති උපාධි පිළිබඳ විස්තර

I . ලබා ඇති උපාධිය සහ විෂයයන් : ..........................................................................
..........................................................................
..........................................................................

II. එම සහතිකය වලංගු දිනය..........................................................................

III. උපාධිය ලබා ඇති විශ්ව විද්‍යාලයේ/ආයතනයේ නම..........................................................................
..........................................................................

5.3 ලබා ඇති පශ්චාත් උපාධිය පිළිබඳ විස්තර :

I. ලබා ඇති පශ්චාත් උපාධිය : ..........................................................................

II. එම සහතිකය වලංගු දිනය : ..........................................................................

III. පශ්චාත් උපාධිය ලබා ඇති විශ්ව විද්‍යාලයේ/ආයතනයේ නම : ..........................
..........................................................................

( ලබා ඇති උපාධි සහතිකවල පිටපත් අමුණන්න. )

6.0 ඔබ කවරදාක හෝ කවර චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද?
( අදාළ කොටුවේ √ ලකුණ යොදන්න) (ඔව් නම් විස්තර සඳහන් කරන්න)

| ඔව් | | | නැත | |
|---|---|---|---|---|

7.0 දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු වූවකු නම්,

7.1 දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ ලිපිනය : ..........................................................................

7.2 දැනට දරන තනතුර : ..........................................................................

7.3 සේවා කාලය : ..........................................................................

7.4 ස්ථිර විශ්‍රාම වැටුප් හිමි හෝ තාවකාලික ද යන වග : ..........................................................................

8.0 විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර

(i) විභාග ගාස්තු ගෙවූ කාර්යාලය :..........................................................................

(ii) ලදුපතේ අංකය හා දිනය :..........................................................................

(iii) ගෙවූ මුදල :..........................................................................

ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න
*( ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)*

9.0 අයදුම්කරුගේ සහතිකය

(අ) මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බවත්, ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ /හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟ වෙමි. තවද, මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

(ආ) මවිසින් කරනු ලබන මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත් පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.

(ඇ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

(ඈ) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පැවැත්වීම සම්බන්ධයෙන් සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

( ඉ) මම මෙම තනතුර සඳහා සුදුසුකම් ලද හොත් සබරගමුව පළාතේ අවම වශයෙන් වසර 05 ක් සේවය කිරීමට එකඟවෙමි.

.......................................  .......................................
දිනය  අයදුම්කරුගේ අත්සන

10.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරනු ලබන........................................................ මයා / මිය / මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද, ඔහු / ඇය මා ඉදිරිපිට දී ......................... දින ඔහුගේ / ඇයගේ අත්සන තැබූ බව ද, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බව ද එම ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

.........................................  ....................................................
දිනය  සහතික කරන නිලධාරියාගේ අත්සන

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම: ..........................................................................
තනතුර: ............................................
ලිපිනය: ............................................
( නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

11.0 රජයේ හෝ පළාත් රාජ්‍ය සේවාවන්හි දැනට සේවයේ නියුතු අයදුම්කරුවකු නම් පහත සඳහන් සහතිකය ආයතන ප්‍රධානියා, දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරා ඇති නිළධාරියකු විසින් කළ යුතුය.

(අ) මෙම දෙපාර්තමේන්තුවේ ............................................................................ දින සිට ........................................................................................ තනතුරේ සේවය කරන ..........................................................................................................මහතා/ මහත්මිය/මෙනවිය ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනට උපයාගත යුතු සියළුම වැටුප් වර්ධක උපයාගෙන ඇති බවත්, අවවාද කිරීම් හැර කිසිඳු විනය දඬුවමකට භාජනය වී නොමැති බවත්, අයදුම්පතේ සපයා ඇති විස්තර නිවැරදි හා සත්‍ය බවත් සහතික කරමි.

(ආ) ඉහත තනතුර සඳහා ඔහු/ඇය තෝරා ගතහොත් අයදුම්කරු දැනට දරන තනතුරෙන් මුදා හැරිය හැකි / නොහැකි බවත් දන්වමි.

..............................................................
දෙපාර්තමේන්තු ආයතන ප්‍රධානියා හෝ බලය පවරනු ලබන නිළධාරියාගේ අත්සන

නම: ..................................................
පදවිය: ..............................................
දිනය..................................................
දෙපාර්තමේන්තුව/ආයතනය...................
( නිල මුද්‍රාව තබන්න.)